# අත්පොත

# ප්‍රාදේශීය යහපාලනය

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

European Union

ISBN: 978 - 955 - 1281 - 49 - 6

සියළුම හිමිකම් ඇවිරිණි.
මෙහි අන්තර්ගත වන කරුණු උපයෝගී
කරගැනීමේදී/ ප්‍රකාශනය කිරීමේදී
ඒ සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්
ශ්‍රී ලංකා ආයතනයෙන් ලිඛිත අවසරය
ලබාගෙන තිබිය යුතුය.

2011 දෙසැම්බර්

# පටුන

| | |
|---|---|
| පෙරවදන | 01 |
| හැඳින්වීම | 02 |
| ශ්‍රී ලංකාවේ පළාත් පාලන උරුමය හා එහි විකාශය | 03 |
| ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන ව්‍යුහය සහ පළාත් පාලන ආයතන | 04 |
| පළාත් සභා ක්‍රමය තුළ හවුල් පරිපාලනය ව්‍යුහය | 05 |
| ප්‍රශස්ත පළාත් පාලන ආයතනයක තිබිය යුතු යහපාලන ගුණාංග හා එහි වර්ධන උපායය මාර්ග | 08 |

# අත්පොත
# ප්‍රාදේශීය යහපාලනය



# පෙරවදන

පළාත් පාලනය යනු ජනතාවගේ වැදගත් හා මූලික සේවාවන් රැසක් ලබාදෙන්නා වූ සාමාන්‍ය ජනජීවිතයට වඩාත් සමීප පාලන පද්ධතියකි. අපට අවශ්‍යම සේවාවන් වන යහපත් මාර්ග පද්ධතියක් පවත්වාගෙනයාම, ප්‍රාථමික අධ්‍යාපන ආයතන හා සෞඛ්‍යය සේවාවන් පවත්වාගෙනයාම, බෝවන රෝග මර්දන ව්‍යාපාර පවත්වාගෙනයාම, වෙළඳසල් පවත්වාගෙන යෑමට අතහිතදීම යනාදිය පළාත් පාලන ආයතන මගින් ඉටුවන්නා වූ සේවාවන් සමහරකි. නියමිත කාලයන්හිදී පවත්වන්නා වූ මැතිවරණ තුළින් මෙම ආයතනවලට අවශ්‍ය නායකයන් පත්කිරීමට ජනතාවට අවස්ථාව ලැබේ. මෙසේ පත්වන්නා වූ නායකයන්ට ජනතා අවශ්‍යතා හඳුනාගෙන ඒවා සාධාරණව හා වෘත්තීමය ලෙස තෘප්තිමත් කරගැනීමට අවශ්‍යවන නෛතික පසුබිම සකස් කරමින් නීති හා ප්‍රඥප්ති සම්පාදනය කිරීමේ භාරදූර කාර්යය පැවරේ. මෙනිසා පළාත් පාලන ආයතනවල මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම අවශ්‍යම දෙයකි. එමෙන්ම පළාත් පාලන ආයතනවලට ජාතික මට්ටමේ ආයතනවලට වඩා ඉතා පහසුවෙන් ජනතාවට වගවීමට සංවිධානය විය හැකිය.

එසේ වුවත් රාජ්‍යය පරිපාලනය හා නියෝජිත ක්‍රමය අතර ඇත්තා වූ වෙනස පිළිබඳ බොහෝ ශ්‍රී ලාංකික ජනයා තුළ අදහසක් නොමැත. පළාත් පාලන පද්ධතිය කාර්යක්ෂමව, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින් ක්‍රියාත්මක නොවුවහොත් ජනතා අවශ්‍යතා වඩාත් කාර්යක්ෂමව හා අඩු වියදමකින් සපුරාලිය නොහැක. එසේම ජාතික තලයේ ආයතන වඩාත් විධිමත්ව හා සංවිධානාත්මකව ක්‍රියාත්මක වන විට පළාත් පාලන ආයතනද වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක වේ. එම නිසා පළාත් පාලන මට්ටමේදී ගන්නා වූ තීරණ ඒ මට්ටමේදීම ගත යුත්තේ ජාතික මට්ටමේ නායකයින්ගේ කිසිදු බලපෑමකින් තොරවය.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය මගින් සම්පාදනය කර ඇති මෙම **'ප්‍රාදේශීය යහපාලනය අත්පොත'** හි හොඳ පළාත් පාලන ආයතනයක් තුළ තිබිය යුතු අංග ගණනාවක්, වැදගත් ආයතන පිළිබඳ කරුණු රාශියක් එකට ගොනුකර ඇත. මෙම අත්පොතෙහි පළාත් පාලන ආයතනයේ පැවැත්මට හේතුවන කරුණු සමහරක් සඳහන්වන අතර විධිමත් ලෙස පළාත් පාලන ආයතනවල ජනතා සහභාගීත්වය ඇතිකිරීම තුළින් එම ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැක්කේ කෙසේද යන්නද විග්‍රහ කෙරේ. මෙසේ පළාත් පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම තුළින් ප්‍රජාතන්ත්‍රවාදය සැබවින්ම අර්ථවත් කළ හැකිය.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය උදෙසා මෙම අත්පොත සම්පාදනය කිරීම පිළිබඳව පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳ පරිපූර්ණ දැනුමකින් යුත් පියතිස්ස රණසිංහ මහතාට මාගේ ප්‍රණාමය පුදකරමි. එසේම ආචාර්ය විලී මෙන්ඩිස් මහතා මෙම අත්පොතෙහි ගුණාත්මකබව වැඩිකිරීම උදෙසා සිදුකළ විචාරාත්මක ඇගයීමටද මාගේ ප්‍රණාමය පුදකරමි. තවද මෙම අත් පොත සම්පාදනය කිරීමේදී යක්කලමුල්ල ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා ඇතුලු සමස්ත කාර්යය මණ්ඩලය සහ ප්‍රදේශවාසී ජනතාව දැක්වූ සහයෝගය මහත් සේ අගය කරමි.

ආචාර්ය විජය ජයතිලක
විධායක අධ්‍යක්ෂක

# හැඳින්වීම

''පළාත් පාලන ආයතන'' යන වචනය අර්ථකථනය කරන සහ එහි මූලික ලක්ෂණ විග්‍රහ කෙරෙන නොයෙකුත් මතවාද තිබේ. ඒ සෑම විග්‍රහයකම ආවරණය කරන වැදගත් කරුණු දෙකක් තිබේ.

පළමුවැන්න ''රාජ්‍යයකට වඩා කුඩා බල ප්‍රදේශයක ක්‍රියාත්මක වන හෙයින් ජනතාවට වඩාත් සමීපතම මහජන නියෝජිතයින් ඇති ආයතනය පළාත් පාලන ආයතනය'' බවයි.

දෙවැන්න ''සිය බල ප්‍රදේශය තුළ සුබවිහරණය සහ පොදු පහසුව පිළිබඳව ජනතාවට වගකියනු ලබන්නා වූද එම වගකීම සපුරාලීම උදෙසා සම්පත් සහ බලය හිමිව ඇත්තාවූද ස්වයං පාලන ආයතනය'' බවයි.

මෙම විග්‍රහයන් මගින් සනාථ කෙරෙන මූලික කරුණ වන්නේ පළාත් පාලන ආයතනයක යහපාලනයෙහි පැවැත්ම රඳා ඇත්තේ ජනතාවගේ සහභාගීත්වය හා හවුල්කාරිත්වය මත වන බවයි.

මෙරට පළාත් පාලන ආයතන ගැන කෙරෙන විමංසන වලදී පෙන්වාදී ඇති ප්‍රකට කරුණු 2 ක් තිබේ.

1. මෙරට පළාත් පාලන ආයතන බොහොමයක යහපාලනය ක්‍රමයෙන් පිරිහෙමින් පවතින බව

2. පළාත් පාලන ආයතන සහ ප්‍රජාව අතර සහසම්බන්ධය ක්‍රමයෙන් දුරස්ත වෙමින් පවතින බව

මෙම කරුණු දෙක එකම කාසියක දෙපැත්ත බඳුය. ප්‍රජාවගෙන් දුරස් වන ප්‍රමාණයට යහපාලනයෙන්ද දුරස් වන බව ප්‍රත්‍යක්ෂ වන කරුණකි. මෙම නිසා යහපාලනයෙන් ඉදිරියට ගමන් කරන සහ ජනතාවගේ සුබවිහරණය හා පහසුව පිළිබඳව ඵලදායී සේවයක් සලසන පළාත් පාලන ආයතන පද්ධතියක් මෙරට ගොඩනැගිය හැක්කේ පළාත් පාලනයෙහිලා ප්‍රජා සහභාගිත්වය හා දායකත්වය වර්ධනය කිරීමෙන් පමණි. මෙම අත් පොත සම්පාදනය කර ඇත්තේ පළාත් පාලන ආයතනයන්හි යහපාලනය වර්ධනය කිරීම උදෙසා ප්‍රජා දායකත්වය සහ සහභාගිත්වය වර්ධනය කිරීමේ උපාය මාර්ග හඳුනාගැනීමත් ඒ පිළිබඳව ක්‍රියාකාරී වැඩසටහනකට ප්‍රවේශවීමටත් ඇති අවස්ථාවන් සාකච්ඡාවට භාජනය කිරීමේ අරමුණ සපුරා ගැනීම උදෙසාය.

තම බලප්‍රදේශවල පවත්නා විශේෂ තත්වයන්ට අනුකූල වන පරිදි යෝග්‍ය උපායය මාර්ග අවශ්‍ය ගැළපීම් සහිතව ක්‍රියාවට නැංවීමෙන් ප්‍රජා සහභාගිත්වය හා දායකත්වය තුළින් පළාත් පාලන ආයතනයන්හි යහපාලනය වර්ධනය කරගැනීමට ප්‍රදේශයේ ජනතාවට, සිවිල් සංවිධානවලට, පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ට, එම ආයතනවල සේවයේ නියුතුවුවන්ට සහ සේවා ලාභීන්ට මෙමගින් මගපෙන්වීමක් සලසාදීම මෙහි මූලික අරමුණ වේ.



# ශ්‍රී ලංකාවේ පළාත් පාලන උරුමය හා එහි විකාශය

අද මෙරට පවත්නා පළාත් පාලන ආයතන ක්‍රමය ආගන්තුක සංකල්පයක් නොවේ. වසර 2500 ක් තරම් ඈතට දිවෙන අපේ සමාජ අර්ථක්‍රම සාරධර්ම හා පොදුජන ජීවිතය හා බැඳුනු ආයතන රාමුවක විකාශනයකි.

අපේ ඈත අතීතයෙහි ක්‍රිස්තු පූර්ව 4 වන සියවසෙහි පණ්ඩුකාභය රජතුමාගේ කාලයෙහි අනුරාධපුර නගරය පිහිටුවීමේදී පළාත් පාලන ක්‍රමයක් පැවැති බව පෙනේ. ක්‍රිස්තු පූර්ව 2 වන සියවසේ තඹගල්ල සෙල් ලිපියද, 10 වන සියවසේ තුන්වන උදය රජු පිහිටවූ බදුලු ටැම් ලිපියද, වේවැල් කැටිය සෙල්ලිපියද පැරණි තිබූ ගම් සභා සහ නාගරික පාලන ක්‍රම ගැන තොරතුරු සපයයි.

මහනුවර සහ කෝට්ටේ රාජධානි සමයෙහිද ගම් සභාව ජනසම්මතවාදී සංවිධානයක් ලෙස පැවැති බවට රාජසිංහ රජුගේ මල්වාන ගිවිසුමද රොබට් නොක්ස් ගේ ලංකාව ගැන ලියූ ග්‍රන්ථයද සනාථ කරයි.

1815 දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට ලංකාව යටත්වූ පසු 1818 දී පැරණි ගම් සභා ක්‍රමය අහෝසි කළ නමුත් ඉංග්‍රිසි ආණ්ඩුව විසින් ඇලවේලි හා වාරිමාර්ග පරිපාලනයට 1856 දී ගම් සභාව නැවත පිහිටුවන ලදී. 1871 දී වැඩි බලතල සහිත නව ගම් සභා ක්‍රමයක් ඇති කරන ලදී. 1980 සංවර්ධන සභා පිහිටුවන තුරුම ක්‍රියාත්මක වූ පැරණි ගම් සභාව සංවර්ධන සභා අහෝසිවීමෙන් පසුව 1987 දී ප්‍රාදේශිය සභා නමින් නැවත වැඩි බලතල සහිතව පිහිටුවා තිබේ.

1865 දී විශාල නගර සඳහා මහ නගර සභා පිහිටුවන ලදී. සංශෝධන ගණනාවකට ලක්වී අද පවත්නා මහ නගර සභා 1987 අංක 16 දරන ඇඥාපනත යටතේ පිහිටුවා ඇත. 19 වන සියවසේ මැද භාගයේදී රට තුළ මධ්‍යම පරිමාණයේ නගර පද්ධතියක් බිහිවූ අතර ඒවා පාලනය සඳහා 1892 දී සෞඛ්‍ය මණ්ඩල නමින් ආයතනයක් ඇති කළ අතර 1920 දී එය පළාත් ආණ්ඩු සභා බවට පරිවර්තනය කරන ලදී. 1929 අංක 61 දරන ආඥාපනත මගින් පළාත් ආණ්ඩු සභා වෙනුවට අද පවතින නගර සභා ඇති කරන ලදී.


1987 දී පනවන ලද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් සභා මෙරට ඇති කරන ලදී. පළාත් සභා සංස්ථාපනය කිරීමත් සමග මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශිය පරිපාලනය හා අධීක්ෂණය පළාත් සභා වලට පවරන ලදී. ඒ සමගම එයට පෙර පැවැති සංවර්ධන සභා අහෝසිකර ප්‍රාදේශිය සභා පිහිටුවීමටද පළාත් පාලන ආයතන වලට නියෝජිතයින් තේරීමේ කොට්ඨාස ක්‍රමය වෙනුවට අනුපාත ඡන්ද ක්‍රමය හඳුන්වාදීම ද 87/88 කාලයේදී සිදු කරන ලදී.

# ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන ව්‍යුහය සහ පළාත් පාලන ආයතන

1988 මෙරට පළාත් පාලනයෙහි ගමන් මග වෙනස් කළ වර්ෂය වේ. ඒ හේතු 3 ක් මතයි.

1. පළාත් සභා ඇති කර පළාත් පාලන ආයතන පරිපාලනය හා අධික්ෂණය පළාත් සභා වලට පැවරීම.
2. ප්‍රාදේශිය සභා සංස්ථාපනය කිරීම.
3. කොට්ඨාස ක්‍රමය වෙනුවට අනුපාත ඡන්ද ක්‍රමය මත සභාවලට නියෝජිතයින් තෝරා පත්කරගැනීම උදෙසා මැතිවරණ ක්‍රම සංශෝධනය කිරීම.


අද මෙරට පළාත් පාලන ආයතනයන්හි ව්‍යුහය පහත සඳහන් පරිදි නිර්මාණය වී තිබේ.



# පළාත් සභා ක්‍රමය තුළ හවුල් පරිපාලන ව්‍යුහය

මහ නගර සභා නගර සභා
ප්‍රාදේශිය සභාවල තිරසාර
පැවැත්මත්,
අනන්‍යවූ අරමුදලක්, නිශ්චිත
කාර්යය භාරයක් ඇති
මහජන සංවිධානයකි.

එය ජනතාව වෙනුවෙන්,
ජනතාව උදෙසා, ජනතාව
විසින් ඵලදායී ලෙස
පවත්වාගෙන යායුතුයි.



සිංහල රාජාණ්ඩු සමයේ සිටම වසර 2400 ක් පමණ පැරණි ජනසම්මතවාදී මහජන ආයතනයන් වූ ගම් සභා ක්‍රමයද ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේදී පමණ ආරම්භ වූ නාගරික පරිපාලන ක්‍රමයද පසුබිම් කොට වර්ධනය වූ මෙරට පළාත් පාලන ක්‍රමය පෞරාණික ගුණාංග හා බ්‍රිතානය සංකල්පවල ඒකාබද්ධ දායාදයකි. 1987 දී හඳුන්වා දෙන ලද 13 වන ආණ්ඩු ක්‍රම සංශෝධනයෙන් අනතුරුව රජයේ සහ පළාත් සභාවල හවුල් පරිපාලනයට එය යටත්ව තිබේ.

- අලුතින් සභා සංස්ථාපනය කිරීම සහ ඒවායේ ස්වරූපය එනම් මහනගර සභාවක්ද, නගර සභාවක්ද, ප්‍රාදේශීය සභාවක්ද යන්න නිශ්චය කිරීම රජයට කළ හැකිය.

- පාර්ලිමේන්තුව සම්මත කළ අණ පනත් අනුව පළාත් පාලන ආයතනවලට හිමි බලතල වගවීම හා කාර්යභාරය නීතියෙන් නියම කර තිබේ.

    - 1947 අංක 16 දරන ආඥාපනතින් සංශෝධිත 1865 අංක 17 දරණ මහ නගර සභා ආඥාපනත.

    - 1937 අංක 61 දරන නගර සභා ආඥා පනත.

    - 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත මගින් සංස්තාපිත මෙම ආයතන සියල්ලක්ම එයට අනන්‍යවූ බලතල හා කාර්යයන් සහිත රාජ්‍ය සංස්ථා වේ.

- පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, පළාත් පාලන ආයතනවල සංයුතිය, පළාත් පාලන ආයතනවල ව්‍යුහය සහ ස්වරූපය තීරණය කිරීමේ බලය රජය සතුවේ.

- පළාත් පාලන ආයතන විසුරුවා හැරීමේ බලය හා පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ යන බලතල පළාත් සභාව සතුවේ.

- පළාත් පාලන ආයතනවලට නීතියෙන් හිමි වී ඇති බලතල පළාත් සභාවක් විසින් අහිමි කළ නොහැක. අවශ්‍ය නම් අතිරේක බලතල පවරා දිය හැකිය.

# පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති වගකීම්

තනි තනිව පුද්ගලයින්ට හෝ කණ්ඩායමකට සපුරාගත නොහැකි පොදු ජන ජීවිතය සුවදායී සහ පහසු කරන්නා වූ වගකීම් සමූහයක් මෙරට පළාත් පාලන ආයතනවලට පැවරී තිබේ. මෙම වගකීම් ප්‍රධාන කොටස් 6 කට බෙදා දැක්විය හැකිය.

## 1. මහජන සෞඛ්‍යය සහ පාරිසරික සේවා

- **ජලාපවාහනය** - ජලාපවාහන කාණු, ජලමාර්ග ඇතිකිරීම, පවත්වාගෙන යාම හා විධිමත් ලෙස නඩත්තු කිරීම
- **මළාපවාහනය** - පදිංචි නිවාස, ගොඩනැගිලි හා පොදු ස්ථානවල වැසිකිළි, කැසිකිළි ප්‍රමාණවත් බව සනීපාරක්ෂක ලෙස පවත්වාගෙන යාම පිළිබඳව විධිවිධාන යෙදීම
- **කසල කළමණාකරණය** - වීදි, මාර්ග අතුගෑම, කසල එක් රැස් කිරීම, නිවෙස් සහ ස්ථානවලින් ඉවතලන ඝන අපද්‍රව්‍ය ප්‍රවාහනය, බැහැරලන ස්ථාන නඩත්තුව හා අපද්‍රව්‍ය කළමණාකරණය
- **සෞඛ්‍යය සම්පන්න නොවූ ගොඩනැගීම් පාලනය කිරීම** - අධික තදබදය මගහැරීම, රෝග පැතිරීමට ඇති ඉඩකඩ නැති කිරීම
- **පීඩා පාලනය** - ශබ්ද, වායු සහ වෙනත් පාරිසරික මහජන පීඩා මගහැරවීම
- **ආහාරවල සනීපාරක්ෂක භාවය** - නිෂ්පාදනය අලෙවිය හා පරිභෝජනය කරන ස්ථානවල කටයුතු විධිමත් කිරීම, ආහාර පාන පරීක්ෂාව
- **මාතෘ හා ළමා සෞඛ්‍යය** - සායන පැවැත්වීම, බෙහෙත් ශාලා, ප්‍රතිකාර මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
- **රෝග වැළැක්වීම සහ ප්‍රතිකාර සේවා** - සෞඛ්‍ය අධ්‍යාපනය පාරිසරික සෞඛ්‍ය ආරක්ෂාව හා ආයුර්වේද හා බටහිර ප්‍රතිකාර මධ්‍යස්ථාන පැවැත්වීම

## 2. මංමාවත්

## 3. මහජන උපයෝගී සේවා - ඉදිකිරීම හා නඩත්තුව


- පානීය ජලසම්පාදනය
- පොදු ස්ථාන හා ගොඩනැගිලි හා වීදි ආලෝකමත් කිරීම
- වෙළඳ පොළවල්, සති පොළවල් සහ අලෙවිසල් ඇති කිරීම
- පොදු නාන ස්ථාන, නාන තොටුපළවල් ඇති කිරීම
- සුසාන භූමි ආදාහනාගාර ඇති කිරීම
- ක්‍රිඩාංගන, ක්‍රීඩා භූමි, ප්‍රජාශාලා ප්‍රජා මධ්‍යස්ථාන ඇති කිරීම
- විනෝද පහසුකම් සැලැස්වීම

## 4. අධ්‍යාපන සේවා

## 5. සමාජ සුබසාධනය

## 6. සමාජ සංවර්ධන

“මෙම සේවාවන්වලට පරිබාහිරව අක්කරබදු, ඉඩම් විකිණීම සම්බන්ධ විශේෂ බදු සහ ඌන සංවර්ධිත ඉඩම් සඳහා බදු අයකරනු ලබන්නේ ප්‍රාදේශීය සභා වලින් පමණි.”


PARK

# ප්‍රශස්ත පළාත් පාලන ආයතනයක තිබිය යුතු යහපාලන ගුණාංග හා එහි වර්ධන උපායමාර්ග

යහපාලනයට අදාල වන්නාවූ මූලික සංකල්පයන්ට අනුව ප්‍රශස්ත පළාත් පාලන ආයතනයක තිබිය යුතු ගුණාංග සහ ඒවා වර්ධනය කරගැනීමට උපායමාර්ග, ප්‍රධාන උපාය මාර්ග 8 ක් යටතේ සාකච්ඡා කළ හැකිය

1. සහභාගිත්ව සංවර්ධනය
2. සම්මුතියෙන් කටයුතු කිරීම
3. වගවීම
4. විනිවිදභාවය
5. ප්‍රතිචාරාත්මක බව
6. කාර්යක්ෂම බව හා අදාළ බව
7. සාධාරණ බව හා අන්තර්ගත බව
8. නීතිගරුක බව



# 1 සහභාගිත්ව සංවර්ධනය

සභාවේ කටයුතුවලට ප්‍රදේශයේ ප්‍රජාව දක්වන සහභාගිත්වය, දායකත්වය හෝ හවුල්කාරීබව මෙයින් අදහස් වේ.

පළාත් පාලන ආයතන විසින් කළයුතු සංවර්ධන හා සේවා වැඩ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජා සහභාගිත්වය තුළින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඒවා ඉටු කළ හැකිවේ. පොදු මහජන සම්පත්වල ආරක්ෂාව, නඩත්තුව අවම පිරිවැයකින් ඉටු කිරීමට හැකිවීම, නාස්තිය හා දූෂණයෙන් තොරව මුදල් පරිහරණය කිරීමට හැකිවීම හා සැබෑ ජනතා උවමනාවන් ඉටු කිරීමට හැකිවීම සහභාගිත්වයෙන් ලැබෙන වාසිදායක ප්‍රතිඵලවේ.

ප්‍රජා සහභාගිත්වය සංවර්ධනය උදෙසා පළාත් පාලන ආයතනයකට අනුගමනය කළ හැකි උපායය මාර්ග:

i. සභාවේ උපදේශන කාරක සභාවලට ප්‍රදේශයේ පුරවැසියන් පත්කිරීම

ප්‍රාදේශිය සහ නගර සභා අණ පනත් අනුව පත් කරන කාරක සභාවලට ප්‍රජාවගේ නියෝජිතයින් පත්කිරීමෙන් හා මහ නගර සභා විසින් සකස් කරගත් අතුරු ව්‍යවස්ථා මගින් ස්ථාවර කමිටු පුරවැසියන් සමග සාකච්ඡා කිරීමට විධිවිධාන සැළැස්වීමෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට ජන සහභාගිත්වය ලබාගත හැකිය.

ii. අයවැය ක්‍රියාවලියට ජනතාව සහභාගී කරගැනීම

ඉදිරි වර්ෂය සඳහා අයවැය යෝජනා සකස් කරන විට හා අයවැය කෙටුම්පත් සාකච්ඡාව සඳහා ජනතා හවුල්කාරීත්වය ලබාගැනීමට පනත් හා රීති වලින් විධි විධාන සකසා තිබේ. මෙහිදී ප්‍රජාව දැනුම්වත් කර සංවර්ධන හා ආදායම් වියදම් යෝජනා ගැන මහජන අදහස් ලබාගත හැකිය.

iii. සංවර්ධන සහ සේවා සැලසුම්කරණයේදී ප්‍රජා සහභාගිත්වය ලබාගැනීම

දිගුකාලීන හා කෙටිකාලීන සංවර්ධන සැලසුම් සැකසීමේදී මහජන අදහස් හා යෝජනා ලබාගැනීම හා වැඩ ක්‍රියාවට නැංවීමේදී ප්‍රජා දායකත්වය ලබාගැනීම මෙහිදී කළ හැකියි. ප්‍රජා සංවිධාන හඳුනාගෙන ඒවා දායක කර ගැනීම, කොට්ඨාශ හා කලාප අනුව මහජන සැසිවාර පැවැත්වීම, ගැටලු හා දුෂ්කරතා ගැන මහජන අදහස් ලබාගැනීම, වැඩවල ප්‍රගතිය හා කාර්යය සාධනය වාර්තා කිරීම, ප්‍රජාවට පැවරෙන ක්‍රම ඇති කිරීම මෙහිදී වැදගත්වේ.

iv. සභා රැස්වීම්වල මහජන ගැලරි සහභාගිත්වය පුළුල් කිරීම

විධිමත් හා විවෘත ලෙස සභා රැස්වීම, කාර්යය පටිපාටි අනුග මනය කිරීම, මහජන ගැලරිවල පහසුකම් වැඩි කිරීම සභා රැස්වීම් ආවරණය සඳහා ජනමාධ්‍ය සහභාගී කිරීම මගින් ප්‍රජා සහභාගිත්වය පුළුල් කළ හැකියි.



# 2 සම්මුතියෙන් කටයුතු කිරීම

සම්මුතියෙන් කටයුතු කිරීම යනු සාමුහික එකඟත්වය මත ක්‍රියාකිරීමයි. විධායක බලය මත හෝ බහුතරයේ බලය මත තීරණ ගැනීම සම්මුතියෙන් කටයුතු කිරීම නොවේ. සියලු දෙනා සතුටු කිරීම හෝ සියලු දෙනා නිහඬ කිරීමද සම්මුතිය නොවේ. කරනු ලබන කටයුතු පුළුල් ලෙස සාකච්ඡා කොට මනා ලෙස විමංසනය කොට මහජන නියෝජිතයින් ප්‍රජාව සිවිල් සංවිධාන ආදියෙහි සාමූහික එකඟතාවයකින් ක්‍රියාවට නැංවීම සම්මුතියෙන් ක්‍රියාකිරීමයි.

මේ සඳහා පහත සඳහන් උපාය මාර්ග පළාත් පාලන ආයතනයකට අනුගමනය කළ හැකියි.

i. කරනු ලබන කටයුතු පක්ෂ විපක්ෂ සියලු නියෝජිතයින් සමග සාකච්ඡා කිරීමෙන් එකඟත්වයකට එළැඹීම

ii. සෑම වැඩකදීම සම්මුති නායකත්ව රීති පිළිපැදීම

iii. සංවර්ධන වැඩසටහන් ජනතා කැමැත්තට ඉදිරිපත් කිරීම

iv. සභා යෝජනා ඒකමතිකව සම්මත කිරීම

v. සම්මුතියට පැමිණිය නොහැකි කරුණු පිළිබඳව අදාළ පාර්ශව සමග විස්තරාත්මකව සාකච්ඡා කිරීම



# 3 වගවීම

වගවීම යනුවෙන් අදහස් කරන්නේ ආයතනය කරනු ලබන සියලු කටයුතු පිළිබඳව පිළිතුරු දීමටද, සෑම කාර්යයකටම වගකීමටද ජනතාව ඉදිරියේ බැඳී ඇති බවයි. වැඩ හා සේවාව, යොදන මුදල්, යන්ත්‍ර සූත්‍ර, පුද්ගලයින් සම්බන්ධව ප්‍රතිලාභ මහජනයා වෙත ලැබෙන බවට සභාව වගවිය යුතුයි. ජනතාවට අවශ්‍ය දේ ඉටු කිරීම, කරනු ලබන කටයුතු නිසි පටිපාටි අනුව කිරීම, මහජන අපේක්ෂාවන් ඉටුවී තිබීම යන කරුණු සෑබෑ වගවීමකදී සපුරා තිබිය යුතුයි.

මෙම අවශ්‍යතාවය ඉටු කිරීමේ උපාය මාර්ග මෙසේය:

i. ජනතා සහභාගිත්වය ඇතිව සෑම වැඩකම ප්‍රතිඵල හා ප්‍රතිලාභ ඇගයීමේ ක්‍රම අනුගමනය කිරීම

ii. ප්‍රජාව විසින් වියදම් ආදායම් විමංසනය කෙරෙන සරල ප්‍රජා විගණන ක්‍රියාවලියක් අනුගමනය කිරීම

iii. වැඩ ඇරඹීමේ සිට අවසන් ප්‍රතිඵල භුක්ති විඳීම නඩත්තුව හා පවත්වාගෙනයාම ගැන ජනතාව සමග සක්‍රීය අඛණ්ඩ සංවාදයක් පවත්වාගෙන යාම

iv. ජනතා වගකීම් ඉටු කරන ජනතාව වෙනුවෙන් කැප වූ කාර්යාල සංවිධානයක් හා මනා පුහුණුව ලැබූ විනය සහිත කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යාම



# 4 විනිවිදභාවය

ආයතනයෙහි සියලුම කටයුතු විවෘත ලෙස ද ලාභ ප්‍රයෝජන අපේක්ෂා වලින් තොරව ද මෙහෙයවීම මෙයින් අදහස්වේ.

විනිවිදභාවය ආරක්ෂා කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය.

i. ආදායම් රැස්කිරීම, මුදල් පරිහරණය, භාණ්ඩ හා දේපළ භාවිතය සේවා හා සැපයුම් ඉටු කිරීම, දේපළ බදුදීම සේවකයින් බඳවා ගැනීම පිළිබඳ නීතිරීති නිවැරදිව පිළිපැදීම

ii. ජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාවට නැංවීම

iii. සම අවස්ථා සැලසෙන පෞද්ගලික බැඳීම් වලින් තොර කාර්යය පටිපාටි පිළිපැදීම

iv. වාර්ෂික බදු බලපත්‍ර ගාස්තු සෑම වර්ෂයකම මහජනතාවගේ දැනගැනීම පිණිස ප්‍රකාශයට පත්කිරීම හා කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීම

v. කාරක සභා කළමණාකරන කමිටු හා කාර්යය මණ්ඩල රැස්වීම් සෑම මසකම පැවැත්වීම සහ සියලු තීරණ ඒවායේ සාකච්ඡා කිරීම

vi. අවිධිමත් කණ්ඩායම් හා අක්‍රමවත් ක්‍රමවේද වර්ධනයවීම වැළැක්වීම උදෙසා සෑම මාස 6 කට වරක් හෝ වසරකට වරක් නිලධාරින් අතර රාජකාරි හුවමාරු කිරීම



# 5 ප්‍රතිචාරාත්මක බව

ආයතනයක් විසින් ඉටුකළයුතු ජනතා සේවාවන් හා උවමනා එපාකම් පිළිබඳව සංවේදී වීම හා සාධාරණ හා පිළිගත හැකි කාලයක් තුළ සේවාවන් ඉටුකරදීම ප්‍රතිචාරාත්මක බව ලෙස සලකනු ලැබේ.

මෙම කාරණය ඉටුකිරීම උදෙසා පහත සඳහන් ක්‍රියාමාර්ග පළාත් පාලන ආයතනයක අනුගමනය කළ හැකියි.

i. පුරවැසි ප්‍රඥප්තියක් ප්‍රකාශ කර ඒ අනුව නිශ්චිත කාලය තුළ මහජන සේවා ඉටුකිරීම

ii. මහජන සම්බන්ධතා නිලධාරියකු නම් කර මහජන ඉල්ලීම් ඉටුකර දීමට මග පෙන්වීම

iii. මහජන පැමිණිලි පොතක් සහ මහජන පැමිණිලි පෙට්ටියක් සභාවෙහි තබා එයින් ලැබෙන පැමිණිලි/ දුක්ගැනවිලි කඩිනමින් විසඳීමට ක්‍රියාකිරීම

iv. සභාවට එන සියලුදෙනා පිළිගෙන ඔවුන්ගේ ඉල්ලීම් වලට සවන්දීම

v. මහජන දිනයන් නියමකර සභාපති නගරාධිපති හා මහජන නියෝජිතයින් සෘජුවම හමුවීමේ පහසුව මහජනයාට ලබාදීම

vi. මහජන නියෝජිතයින් සභාවට ගෙන එන සේවා ඉල්ලීම් විමංසනය කර කඩිනමින් පිළිතුරු ලබාදීම

vii. නිලධාරීන් නිවාඩු යන කල්හි එම වැඩ ආවරණය උදෙසා නිශ්චිත වැඩ සටහනක් ක්‍රියාවට නැංවීම

viii. මහජන අදහස් උදහස් විමසන ජනසමීක්ෂණ හෝ මත විමසුම් කාලීනව සෑම අංශයකම පැවැත්වීම



# 6 කාර්යක්ෂම බව හා කාර්යයන් හි අදාළ බව

ආයතනයක ඵලදායී බව මහජන තෘප්තිය හා විශ්වාසය දිනාගැනීම මත රඳාපවතී. එය ඉහළ නැංවිය හැක්කේ කඩනමින් හා අපේක්ෂිත ප්‍රතිඵල ජනතාවට ලැබෙන පරිදි වැඩ සහ සේවා ඉටු කිරීමෙනි. කාර්යක්ෂම බව සහ අදාල බව සුරැකීම හා වර්ධනය පිණිස පහත උපාය මාර්ග පිළිපැදිය යුතුය.

i. සෑම වැඩක්ම නිශ්චිත කාලවකවානු සහිත සැලැස්මකට අනුව මෙහෙයවීම

ii. වැඩ කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය වන කාර්ය පටිපාටි රීති අඩංගු උපදෙස් හා මාර්ගෝපදේශ පිළියෙල කර ක්‍රියාවට නැංවීම

iii. සෑම කටයුත්තක්ම පිළිගත් පරිපාලන හා තාක්ෂණ පිරිවිත හා ප්‍රමිතීන් අනුව ඉටුකිරීම

iv. සැබෑ උවමනාවන් හඳුනා ගැනීමට  ප්‍රජා සහභාගිත්වය උපයෝගී කරගැනීම

v. විධිමත් ලෙස රාජකාරී හා වගකීම් බෙදාහැරීම ලේඛන ලිපිගොනු කළමණාකරණය දියුණු කිරීම වැඩ අධීක්ෂණ ක්‍රම වර්ධනය ක්‍රියාවට නැංවීම මගින් සමස්ත කළමණාකරණය කාර්යක්ෂම කිරීම

vi. සෑම සංවර්ධන වැඩකටම ශක්‍යතා අධ්‍යයන තාක්ෂණික වාර්තා පිළියෙලකර කාරක සභා සහ මහ සභාවල අනුමැතිය ලබාගැනීම

vii. විධිමත් ප්‍රගති සමාලෝචන හා විමංසන ක්‍රියාවලියක් ආදායම් වියදම් හා සේවා වැඩ පිළිබඳව අනුගමනය කිරීම

viii. පිරිවිතර හා සාකච්ඡා වාර්තා රහිතව වැඩ සේවා හෝ සැපයුම් ක්‍රියාත්මක නොකිරීම


02-12-11

# 7 සාධාරණ බව සහ අන්තර්ගත බව

ආයතන බල ප්‍රදේශයෙහි සෑම ගමක්, වීදියක්, ප්‍රදේශයක් හෝ සෑම ජනවර්ගයක් සෑම ආගමික කණ්ඩායමක්. සෑම සමාජ පංතියක් අතර සාධාරණ ලෙස සම්පත් හා සේවා බෙදාහැරීම හා සෑම ගමක්ම, සෑම ජනවර්ගයක්ම, සෑම පුරවැසි හා සමාජ කණ්ඩායමක්ම අන්තර්ගතවන සේ වැඩ හා සේවා සම්පාදනය කිරීම මෙයින් අදහස්වේ.

සාධාරණ බව හා අන්තර්ගතභාවය ජනතාවට ලබාදිය හැක්කේ බල ප්‍රදේශය තුළ සමාජ ආර්ථික භූගෝලීය සහ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු ගැන සැබෑ අවබෝධයක් ආයතනය සතුව තිබේනම් පමණි.

සාධාරණ බව සහ අන්තර්ගත බව සපුරාලන ආයතනයකට ඒ සඳහා පහත උපාය මාර්ග අනුගමනය කළ හැකියි.

i. සභා බල ප්‍රදේශයේ සියලුම සමාජ ආර්ථික තොරතුරු හා දත්ත එක්
රැස් කරගෙන යාවත්කාලීන ව පවත්වාගෙන යාම හා ඒවා පදනම් කරගෙන සංවර්ධන වැඩ සටහන් සැදීම

ii. ප්‍රජා උවමනා එපාකම් ගැටළු දුෂ්කරතා හඳුනාගත හැකි සම්බන්ධතා ජාලයක් වර්ධනය කිරීම

iii. වැඩ සහ සේවා පිළිබඳ සැලසුම් සෑම කොටසකම ප්‍රජා සහභාගිත්වය මත සකස් කිරීම

iv. සෑම ගමක් සෑම කොට්ඨාසයක් සෑම ජනවර්ගයක් අතර සාධාරණ ලෙස සම්පත් බෙදීයාම සහතික කරන සැලැස්මක් සම්පාදනය කර ක්‍රියාවට නැංවීම

v. සාධාරණව සහ යුක්තිගරුකව ක්‍රියාකිරීම සහතික කෙරෙන සේ සභාවේ කටයුතු වගකීම් ගැන ප්‍රජාව දැනුම්වත් කිරීම



# 8 නීතිගරුක බව

ආයතනය නීතිගත සංස්ථාවක් සේ සලකා අණපනත්, අතුරු ව්‍යවස්ථා, රීති හා රට තුළ බල පවත්නා නීති රෙගුලාසි වලට අනුව කාර්යයන් ඉටු කිරීම නීතිගරුකභාවය නම් වේ. මේ ගුණාංගය ඉටු කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග මෙසේය:

i. විගණනය හා විමර්ශනය විසින් පෙන්වා දී ඇති අඩුපාඩු හා දෝෂ දර්ශන වහා නිවැරදි කිරීම හා යළි ඇති නොවීමට අවශ්‍ය පියවර ගැනීම

ii. නීති, රෙගුලාසි, චක්‍රලේඛන අණපනත්, කාර්යය පටිපාටි ගැන මහජන නියෝජිතයින් හා නිලධාරීන් දැනුම්වත් කෙරෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

iii. නියමිත කාලය තුළ ආදායම් වියදම්, ගිණුම් වාර්තා සකසා සභාගත කිරීම. බදු හා ආදායම් ගැන නීතිමය පියවර ගැනීම සම්පත් දේපළ හා වත්කම් ආරක්ෂණ විධිවිධාන යෙදීම, නීතියට පටහැනි ක්‍රියාවන්ට විරුද්ධව පියවර ගැනීම සහ පරිපාලන ක්‍රියාකාරකම් නිවැරදිව ඉටු කිරීම

iv. සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම හා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම

## උපුටා ගැනීම්


- "Commission Report of Inquiry on LG Reforms 1999." Commission Report . 1999.
- Exiner, Ron. Good Governance Guide. Victoria: Good Governance Advisory Group , 2004.
- Foundation, The Asia. Regulatory Mapping: Guide Book on Government Services Urban Councils. Colombo: The Asia Foundation, 2007.
- Regulatory Mapping: Guide book on Local Government Services Municipal Councils. Colombo: The Asia Foundation , 2007.
- Regulatory Mapping: Guide Book on Local Government Services Pradeshiya Sabhas. Colombo : The Asia Foundation, 2007.
- Ceylon Gazette, Gazette No. 8458, 16th June 1939
- Socialist Democratic Republic of Sri Lanka Gazette, Gazette No. 549/17, 20th January 1989
- Ceylon Gazette, Gazette No. 555/5, 17th April 1989
- Ceylon, Municipal Council Ordinance no. 16 of 1947
- Socialist Democratic Republic of Sri Lanka, Pradeshiya Sabah Act no. 15 of 1987
- Ceylon, Urban Council Ordinance no. 61 of 1939
- පළාත් පාලන ආයතන උපදෙස් සංග්‍රහය. කොළඹ: පළාත් පාලන අමාත්‍යාංශය, 1989

## ආරාධනයයි

මහජනතාව වෙත වඩාත් උසස් සේවාවක් ලබාදීම සඳහා පළාත් පාලන ආයතන තුළ යහපාලනය වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් සම්පාදනය කරන ලද මෙම අත් පොත පිළිබඳ ඔබගේ අදහස් හා යෝජනා අප වෙත දන්වා එවන්නේනම් කෘතඥ වෙමු.

අපගේ ලිපිනය
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා
අංක 6, 37 වන පටුමග, රැජින පාර,
කොළඹ 3

ඊ මේල් : tisl@tisrilanka.org
වෙබ් අඩවිය: www.tisrilanka.org

මෙතනින් කපා අප වෙත එවන්න

නම

ලිපිනය

දුරකතනය

අදහස් හා යෝජනා

**Delegation of the European Union**
**to Sri Lanka and the Moldives**
26, Sir Marcus Fernando Mawatha, Colombo 7, Sri Lanka
Tel: (94 11) 2674413/4
Fax: (94 11) 2678860
Email: delegation-sri-lanka@eeas.europa.eu
Web: www.eeas.europa.eu/delegations/sri_lanka

Disclaimer:
The publication has been produced with the assistance of the European Union. The contents of this publication are the sole responsibility of Transparency International Sri Lanka (TISL) and can in no way be taken to reflect the views of the European Union.

## අත් පොත

# ප්‍රාදේශීය යහපාලනය

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා**
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා යනු දූෂණය මැඩලීම මූලික අරමුණ කරගනිමින් ක්‍රියාත්මක වන ප්‍රමුඛතම ජාත්‍යන්තර සංවිධානයක් වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්හි ශ්‍රී ලාංකීය නියෝජිතායතනයයි. ලොව පුරා රටවල් රැසක ශාඛා සියයකට අධික ප්‍රමාණයක් පිහිටුවා ඇති ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සමස්ත ජාලයම විනිවිදභාවය, වගවීම හා යහපාලනය ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය පිණිස කැප වී සිටී. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය 2002 වසරේ සිට ශ්‍රී ලංකාව සුපිළිපන් දේශයක් බවට පත් කිරීමේ අරමුණු ඇතිව ස්වයං අරමුදල් සපයා ගැනීමක් සමග ස්වාධීනව ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාව තුළ අල්ලස හා දූෂණය අවම කරමින් යහපාලනය ශක්තිමත් කිරීම සඳහා 2002 වසරේ සිට මෙතෙක් රාජ්‍ය, පෞද්ගලික, මාධ්‍ය හා සිවිල් සමාජ සංවිධාන ඇතුළු අංශ සමග කටයුතු කරමින් ලද අත්දැකීම් මත සැකසූ ක්‍රියාකාරම් සැලැස්මකට අනුව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කටයුතු කරමින් පවතී. ආයතනයේ ක්‍රියාකාරිත්වය ජාතික, පළාත්, පෞද්ගලික, සිවිල් සමාජ, මෙන්ම පුරවැසියන් මූලික කරගනිමින් ඉතා සක්‍රීයව ක්‍රියාත්මක වේ. අවබෝධයකින් යුතුව පාලනය කෙරෙහි ජනතාවගේ සහභාගීත්වය වැඩි කිරීමටත්, පුහුණුව, හැකියාවන් වර්ධනය මෙන්ම දැනුම තුළින් යහපත් සේවාවන් ඇති කිරීමටත්, දූෂණයට එරෙහිවීම තුළ සුපිළිපන් රටක් බිහි කිරීම එහි ඉලක්කයන් අතර වේ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා
අංක 6, 37 වන පටුමග, රැජින පාර, කොළඹ 3

දුරකතන : 0114369781
ෆැක්ස් : 0112506419
ඊ මේල් : tisl@tisrilanka.org
වෙබ් අඩවිය : www.tisrilanka.org

ISBN: 978 - 955 - 1281 - 49 - 6